## 80 දශකයේ දී වාරණයට ලක් වූ ගුවන්විදුලි ගීත පිළිබඳ අධ්‍යයනයක්

ආර්. පී. එච්. යූ. මැණිකේ
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ
hansamala@hotmail.com

1925 දී නිල වශයෙන් මෙරට ස්ථාපිත වූ ගුවන්විදුලිය වනාහි තාක්ෂණික උපකරණ භාවිත කරමින් සන්නිවේදන ක්‍රියාවලියෙහි යොදාගත් ප්‍රථම විද්‍යුත් මාධ්‍ය යි. විචාරක අදහසට අනුව ගුවන්විදුලි රචනා කලාවේ දී දැකිය හැකි ප්‍රධාන අංග දෙකකි. ඒ, භාෂණය හා ගීතය යි. ඒ අනුව ගුවන්විදුලියෙන් නිර්මාණය වූ ගීත හැඳින්වූයේ 'සරල ගීත' (light song) යනුවෙනි. මෙසේ හැඳින්වූ සරල ගීතවලින් ඇතැම් ගීත එක් එක් කාලවලදී ගුවන්විදුලියෙන් ප්‍රචාරය කිරීම වාරණයට ලක් විය. එහෙත් 80 දශකයේ දී කැසට් පටයේ ආගමනයත් සමඟ ම එසේ වාරණයට ලක් කළ ගීත ශ්‍රාවකයාට අසන්නට අවකාශ ලැබුණි. මෙකී පත්‍රිකාවේ අරමුණ වන්නේ 80 දශකයේ දී වාරණයට ලක් වූ එම ගීත පිළිබඳ අධ්‍යයනය කිරීම යි. ඒ සඳහා පාදක කරගනු ලබන්නේ ගුවන්විදුලිය ඇසුරින් නිර්මාණිත සරල ගීත නමින් ව්‍යවහාරයට පත් වූ ගීත යි. සරල ගීත යනු හින්දුස්ථානි-රාගධාරී සංගීත ආභාසයෙන් මිදී වඩා නිදහස් ව හා වෙනත් ආභාසයන් ද සහිත ව නිර්මාණය වූ සංගීත කෘතීන් ය. එය නිර්මාණය වී ඇත්තේ ගේයපද රචකයා, සංගීතඥයා සහ ගායකයා හෝ ගායිකාව යන ත්‍රිපුද්ගල එකතුවෙහි ප්‍රතිඵලයක් ලෙස යි. විනාඩි කිහිපයක කෙටි කාලයක් ඇතුළත රසය, චමත්කාරය, අවබෝධය සහ සන්නිවේදනය ප්‍රේක්ෂකයා වෙත ලබාදීම හේතුවෙන් ගුවන්විදුලි ගීතයට හිමි වූයේ අති මහත් ජනප්‍රියත්වයකි. එහිලා වෙසෙස් දායකත්වයක් ලබා දී ඇත්තේ ගේයපද රචනය බව පැහැදිලි වන්නේ සන්නිවේදනයෙහිලා ගීතයට හිමි වී ඇති ශක්‍යතාව සහ ගීත වාරණය හේතුවෙනි. එ බැවින් මෙම විමර්ශනය සිදු කෙරෙනුයේ 80 දශකයේ දී ගුවන්විදුලියෙන් වාරණය වීම හේතුවෙන් කැසපටවලින් සමාජගත වූ ගීතවල ගේයපද රචනා ඇසුරිනි. එම ගීත වාරණය වීමට බල පෑ ආසන්නතම හේතුව වී ඇත්තේ තදනුබද්ධ සමාජය, එකී ගීතවලින් විවරණය වීම යි. එම සමාජ විවරණාත්මක ගීත මගින් පොදු ජන මතයක් ගොඩ නැගීම ව්‍යර්ථ කිරීම, ගීත වාරණයේ අරමුණ වී ඇත. ඒ අනුව හඳුනාගත හැකි වන්නේ කිසියම් මතයක් සමාජගත කිරීම සඳහා ගීතය සතු ව අසීමාන්තික සන්නිවේදන බලයක් ඇති බව යි. පුද්ගල, ආයතන සහ රජය යනුවෙන් තෙවැදෑරුම් වූ මෙම වාරණය මගින් නො සැලකිලිමත් අයුරින් ගීත නිර්මාණ කප්පාදු කිරීමත් සමකාලීන සමාජ යථාර්ථ සමාජගත කිරීම අවහිර කර ඇති අයුරුත් දැකිය හැකි වේ. එසේ ම වාරණය වූ ගීතවලින් පැහැදිලිව ම තත් සමාජ තත්ත්වයත් එයට එරෙහි ව නැගුණු ජනතා විරෝධයත් හඳුනාගත හැකි වේ. සමාජීය සාහිත්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය නියෝජනය කෙරෙන මෙම පර්යේෂණය මගින් ගීතය වූකලී ප්‍රබල සන්නිවේදන ශක්‍යතාවකින් යුතු කෙටි කලකින් සහෘදයා වෙත සමීප විය හැකි සාහිත්‍යාංගයක් බවත් තත්කාලීන සමාජය පිළිබිඹු කරන කැඩපතක් බවත් සාක්ෂාත් වී තිබේ.

**ප්‍රමුඛ පද:** වාරණය; සන්නිවේදනය; ගේයපද රචනය; ගුවන්විදුලි ගීතය; සරල ගීතය